වගා ආධාර චක්‍රලේඛ අංක : 55

අපේ අංකය : සං/ව/ආ/ප්‍රතිපත්ති
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
2000.05.25 දින.

141

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

## 2000 වර්ෂයේ ප්‍රතිපාදිත මුදල් ප්‍රමාණය අනුව වගා ආධාර මුදල් ගෙවනු ලබන බිම් ප්‍රමාණයන් තීරණය කිරීම.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ " සෙස් " අරමුදල් කමිටුව මගින් 2000 වසර සඳහා අධිකාරිය වෙත ප්‍රතිපාදනය කර ඇති මුදල් වලට අනුකූලවන පරිදි හා ප්‍රතිපාදිත අරමුදල් විධිමත්ව යෙදවීම උදෙසා වගා ආධාර ගෙවනු ලබන බිම් ප්‍රමාණයන්හි පහත සඳහන් සීමාවන් පනවන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

**1. පස සාරවත් කිරීම සහිත තේ නැවත වගා සහ අලුත් වගා අවසර පත්‍ර**

අ. අවසර පත්‍රයේ මූලික වලංගු කාලය ඉකුත්ව නැවත වලංගු කර ඇති අවසර පත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී

i. තේ නැවත වගා උපරිම වශයෙන් **අක්කර එකකටද,**
ii. අලුත් වගා උපරිම වශයෙන් **අක්කර භාගයකටද** සංශෝධනය කර ගෙවීම් කළ යුතුය.

මෙම අවසර පත්‍රවල මූලික වලංගු කාලය ඉකුත්ව ඇති බැවින් ඉහත අනුග්‍රහයද 2000 වර්ෂයේ අදාල වගා කන්නයට සීමා විය යුතු අතර, ඉන්පසු නැවත දීර්ඝ කිරීම හෝ ඒ මත කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුය.

ආ. අවසර පත්‍රයේ මූලික වලංගු කාලය ඉකුත්වී නොමැති වුවද එක් එක් වගා කටයුතු නිම කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් උපරිම කාලසීමාව * ඉකුත්ව ඇති අවසර පත්‍ර සඳහා

i. තේ නැවත වගා උපරිම වශයෙන් **අක්කර එකකට** සහ
ii. අලුත් වගා උපරිම වශයෙන් **අක්කර 1/2 ( භාගය)** කට අවසර පත්‍රය සංශෝධනය කර ඉදිරි ගෙවීම් කිරීමට.

මෙම අනුග්‍රහයද අවසර පත්‍රයේ මූලික වලංගු කාලය නිම වීමත් සමග අවසන් විය යුතු අතර, නැවත දීර්ඝ කිරීමක් හෝ ඒ මත කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුය.

* වගා කටයුතු සඳහා ප්‍රමාණවත් උපරිම කාලය පහත සඳහන් පරිදි ගණනය කරන්න.

| | | |
|---|---|---|
| බිම් සැකසීම | - | මාස 6 |
| පස සාරවත් කිරීම | - | මාස 24 |
| වගාව | - | මාස 6 |
| වසරක් තුල නඩත්තුව | - | මාස 15 |

**2. පස සාරවත් කිරීම රහිත අලුත් වගා අවසර පත්‍ර :**

අවසර පත්‍රයේ මූලික වලංගු කාලය ඉක්මවා මාස 6 ක් ඉකුත්වී ඇති අවස්ථාවලදී යළි වලංගු නොකිරීම හා ඒ මත කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුය.

140

3. පාළු සැපයීමේ අවසර පත්‍ර :

අවසර පත්‍රයේ මූලික වලංගු කාලය මාස 6 ක් ඉක්මවා ඇති අවස්ථාවලදී යළි වලංගු නොකිරීම හා ඒ මත කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුය.

4. රබර් තේ මිශ්‍ර වගා කිරීම :

අවසර පත්‍රයේ මූලික වලංගු කාලය ඉක්මවා මාස 06 ක් ඉකුත්ව ඇති අවස්ථාවලදී යළි වලංගු නොකිරීම හා ඒ මත කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුය. මින් ඉදිරියට අවසර පත්‍ර නිකුත් කිරීමේදී වගා බිම් ප්‍රමාණය අක්කර 2 නොඉක්මවිය යුතු අතර, අවසර පත්‍රය නිකුත් කිරීමට අදාල වන්නාවූ බිම් ප්‍රමාණයෙන් 75% ක් සඳහා හිමිවන සහනාධාර මුදල එක් එක් වාරික සඳහා ගණනය කිරීම් සිදුකර ගෙවීම් කළ යුතුය.

ඉහත අංක 1 - 4 දක්වා කරුණු යටතේ දක්වා ඇති සෑම අවස්ථාවකදීම අවසර පත්‍ර සංශෝධන හෝ බිම් සීමා පැනවීම හෝ අවලංගු කිරීම අවසර පත්‍ර හිමිකරුට දැනුම්දිය යුතුය.

යහපත් මුදල් පාලනයක් ඇතිකර ගැනීම සඳහා පනවනු ලබන ඉහත සඳහන් ගෙවීම් සීමාවන් 2000.06.01 දින සිට ඔබ කාර්යාලය මගින් කරනු ලබන සියලුම ගෙවීම් සඳහා අනුගමනය කළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද මෙහි සඳහන් කරුණු ඔබ කාර්යාලයට අනුයුක්ත සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්, අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් සහ වගා ආධාර අංශවල කටයුතු කරනු ලබන සියලුම නිලධාරීන් හට දැනුම් දීමටත්, ඔවුන් මේ අනුව කටයුතු කරන බවට තහවුරු කර ගැනීමටත් කටයුතු කරන්න.

මෙම චක්‍රලේඛය ඔබ ලද බව හා ඒ අනුව ක්‍රියා කරන බවට මා වෙත දැනුම් දීමට කටයුතු කරන්න.

අත්/කළේ: රෝහණ ඉලංගරත්න
සභාපති

(සුනිල්. එස්. සිරිසේන)
සාමාන්‍යාධිකාරී.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සංවර්ධන/ව්‍යාප්ති/මුදල්
2. සහකාර සාමාන්‍යාධිකාරී - සංවර්ධන/ව්‍යාප්ති/පාලන
3. මුදල් කළමනාකරු
4. අභ්‍යන්තර විගණක
5. සියලුම මාණ්ඩලික නිලධාරීන්
6. ගරු ලේකම් - සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිතිය
7. සියලුම ප්‍රාදේශීය සංවිධාන වල ගරු ලේකම්වරුන්.

} දැනගැනීම සඳහා

Sd/year 2000 pg5-6